## කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තිය සහ එහි තදනන්තර සංශෝධන සහ 2023 අප්‍රේල් 10 වන දින දරන අංක 03/2023 කොමිෂන් සභා චක්‍රලේඛනයේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් උපකුලපති ධුරය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට වයස අවුරුදු හැට තුනකට (63) අඩු විය යුතුය. පත්වීම ලද දින සිට වසර තුනක කාලයක් සඳහා හෝ පත්වීම්ලාභියාගේ වයස අවුරුදු හැට පහක් (65) සම්පූර්ණ වන තුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතුය.

ශ්‍රී ලංකාවේ අගනගරයේ පිහිටි එකම විශ්වවිද්‍යාලය වන කොළඹ විශ්වවිද්‍යාලය එවකට පැවති ලංකා විශ්වවිද්‍යාල කොලීජිය හා ලංකා විශ්වවිද්‍යාලය සම්බන්ධ කළ ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින පුරෝගාමී උසස් අධ්‍යාපන ආයතනයකි. කොළඹ විශ්වවිද්‍යාලය සිය නිත්‍ය හා ව්‍යාප්තිකරන ශාස්ත්‍රාලීය වැඩසටහන් තුළින් පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කරන වැඩසටහන් රාශියක් පිරිනමන ඉහළ කීර්තිනාමයක් හොබවන කලාපීය හා ජාත්‍යන්තරව පැසසුමට ලක්වූ ආයතනයක් ලෙස පිළිගැනේ. ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි හා ව්‍යාප්තිකරන වැඩසටහන් ඔස්සේ දළ වශයෙන් 43,000 ක් පමණ වූ ශිෂ්‍ය ගහනයකට වෘත්තීය හා ප්‍රතිනතය ලත් අධ්‍යයන පාඨමාලා පිරිනමන කොළඹ විශ්වවිද්‍යාලයට මණ්ඩපයක්, පීඨ දහයක් (10), ආයතන හයක් (06) සහ පාසලක් අයත්ය. කොළඹ විශ්වවිද්‍යාලය උපකුලපතිවරයා යටතේ සෘජුවම ක්‍රියාත්මක වන මධ්‍යස්ථාන ගණනාවක් හරහා විවිධ ප්‍රජා සංවර්ධනයන් සහ ජාතිය ගොඩනැගීමේ කටයුතුවල ද ක්‍රියාකාරීව නිරත වේ.

උපකුලපති විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකු විය යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අධ්‍යයන නිල ධාරියාද විය යුතුය. ඇය/ඔහු විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සහ සනාතන සභාවේ යන දෙකෙහිම නිල බලයෙන් පත්වන සාමාජිකයකු වන අතර, සභාපති තනතුරද දරයි. ඇය/ඔහු විශ්වවිද්‍යාලයේ ගණන්දීමේ නිලධාරියා වන අතර, විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම පිළිබඳ වගකීම දරයි. විශ්වවිද්‍යාලයේ කටයුතු කළමනාකරණය කිරීමේදී විනිවිදභාවය, වගවීම සහ යහපාලනය පවත්වා ගැනීම පිළිබඳව උපකුලපති වගකිව යුතු වේ. විධිමත් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීමෙන්, හඳුන්වා දීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් ශාස්ත්‍රීය ප්‍රජාවට නායකත්වය සැපයීම උපකුලපතිගේ වගකීමකි.

උපකුලපති යනු සිය බුද්ධිමය මෙන්ම කළමනාකරණ ප්‍රතිභාවන් තුළින් විශ්වවිද්‍යාලයේ ආයතනික අරමුණු ඉදිරියට ගෙන යාමට සමත් දැක්මක් සහිත පුද්ගලයෙකි. ඊට අමතරව, උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සම්බන්ධව ජාතියේ අවශ්‍යතා හඳුනා ගැනීමද උපකුලපතිවරයාගේ කාර්යයක් වන අතර, පර්යේෂණ හා සංවර්ධනය ඇතුළු ශාස්ත්‍රීය කටයුතු තුළින් විශ්වවිද්‍යාලයේ දියුණුව සඳහා ඉවහල් වන වටිනාකම් ශක්තිමත් කළ හැකි විය යුතුය. එම නිසා අයදුම්කරු උසස් ශාස්ත්‍රීය ප්‍රභාවකින්ද, මනා සමෝධානයකින්ද, අනර්ඝ කාර්ය සාධනයකින්ද හෙබි, සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ විවිධ අභිරුචීන් එකසේ උත්තේජනය කිරීමේ සමත්, විශිෂ්ට සන්නිවේදන කුසලතා සහිත අයෙකු වියයුතු යයි අපේක්ෂා කෙරේ.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති වීමේ අභිලාෂී පුද්ගලයාට අස්ථාවර, අභියෝගාත්මක හා පීඩාකාරී අවස්ථාවන්ට උපායශීලීව හා නිපුණතාවයෙන් යුතුව සාර්ථකව මුහුණ දීමට හැකි විය යුතුය. පැවරී ඇති කාර්යය මත පදනම්ව ඇයට/ඔහුට බොහෝ වේලාවක් වැඩ කිරීමටද හැකි විය යුතුය.

උපකුලපතිවරයාට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකුගේ වැටුප සහ තනතුරට අදාළ දීමනා ලැබෙන අතර, ඊට අමතරව වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් ද හිමිවේ.

**අයදුම්පත පහත සඳහන් ලේඛනවලින් සමන්විත විය යුතුය.**

(i) උපන් දිනය ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාව

(ii) කොළඹ විශ්වවිද්‍යාලයේ දියුණුව සඳහා පෞද්ගලික දැක්ම ප්‍රකාශයක් සහ තනතුරට පත් කරනු ලැබුව හොත් අපේක්ෂකයා විසින් ළඟාකර ගැනීමට යෝජනා කරන දෑ පිළිබඳ ගැන කෙටි විස්තරයක්.

(iii) අයදුම්කරු වත්මන් උපකුලපතිවරයා නම් හෝ මීට පෙර මෙම විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර හොබවා ඇත්නම්, ඉහත (i) හා (ii) ඡේදවල දැක්වෙන ලේඛනයන්ට අමතරව ඔහුගේ/ ඇයගේ පළමු ධුර කාලය තුළ ලබාගත් ජයග්‍රහණ ඉස්මතු කෙරෙන වාර්තාවක්.

(iv) අයදුම්කරු කොළඹ විශ්වවිද්‍යාලයෙන් පරිබාහිරව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත ආයතනයක, උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම්, මෙම අයදුම්කරු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක්.

(v) උපකුලපති තනතුර සඳහා අයදුම් කරන අපේක්ෂකයෝ විශේෂ පාලක සභා රැස්වීමකදී ඇගයීම සහ සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබෙති. මෙම ඇගයීම අතරතුර, අපේක්ෂකයන් මිනිත්තු දහයකට (10) නොඅඩු, එහෙත් මිනිත්තු පහළොවක් (15) නොඉක්මවන කෙටි ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුය.

ඉහත දක්වා ඇති පරිදි අදාළ ලියකියවිලි සහිත අයදුම්පත් 2024.10.15 වන දින ප.ව. 3.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් මගින් **ලේඛකාධිකාරී, ලේඛකාධිකාරී කාර්යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03** යන ලිපිනයට එවීම හෝ ගෙනැවිත් භාරදීම සිදු කළ යුතුය. ඊට අමතරව, ඉහත ලේඛනවල මෘදු පිටපතක් සහ වෙනත් කිසියම් ආධාරක ලේඛන වේ නම් ඒවාද PDF ආකෘතියෙන් යුතුව postofvc@cmb.ac.lk යන ලිපිනය වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසාන දිනයෙන් පසු ඉදිරිපත් කෙරෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම්පත සහ අනෙකුත් ලියකියවිලි සහිත ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**උපකුලපති තනතුර**" යනුවෙන් සටහන් කළ යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසාන දිනය 2024 ඔක්තෝබර් 15 වන දින වේ.

**කේ. සී. සංජීවනී පෙරේරා,**
**ලේඛකාධිකාරී සහ පාලක සභා ලේකම්,**
**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.**

**2024 සැප්තැම්බර් 15 වන දින.**